# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
2013 මැයි - අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

ඉතිහාසය - **HIST - E 1025**

ක්‍රි. ව. 1526 දක්වා ඉන්දියාවේ ඉතිහාසය

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. "භාරතීය දේශපාලන වර්ධනයෙහි ලා භූගෝලීය සාධකවල බලපෑම අතිශයින් වැදගත් වේ." සාකච්ඡා කරන්න.

02. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පැවති සමාජ-සංස්කෘතික තත්ත්වය පැහැදිලි කරන්න.

03. ඍග් වෛදික යුගයේ පැවති දේශපාලනික සහ ආගමික තත්ත්වය පශචාත් වෛදික යුගයේදී වෙනස්කම්වලට ලක් වූ ආකාරය පරීක්ෂා කරන්න.

04. ක්‍රි. පූ. හයවන සියවසේ භාරතයේ පැවති දේශපාලනික සහ ආගමික තත්ත්වය පැහැදිලි කරන්න.

05. අශෝක අධිරාජයාගේ කාර්ය සාඵල්‍යය ප්‍රමාණ කරන්න.

06. ගෞතමී පුත්‍ර ශාතකර්ණිගේ පාලන සමය දක්වා සාතවාහන රාජ්‍යය වර්ධනය වූ අයුරු සාකච්ඡා කරන්න.

07. පුෂ්‍යභූති පරපුර යටතේ ථානේශ්වරයේ බලය වර්ධනය වූ අයුරු හර්ෂවර්ධන රජතුමාගේ ක්‍රියාකලාපය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

08. දකුණු ඉන්දියාවේ සංස්කෘතික අභිවර්ධනයෙහි ලා චෝල රජවරුන්ගෙන් සිදුවූ සේවය ප්‍රමාණ කරන්න.

09. ක්‍රි. ව. 1206 දක්වා මුස්ලිම් ආධිපත්‍යය ඉන්දියාවේ ගොඩනැගුණු අයුරු සාකච්ඡා කරන්න.

10. අලා-උද්-දීන්-ඛල්ජි අනුගමනය කළ ප්‍රතිපත්ති දිල්ලි සුල්තානයේ වර්ධනයට කොතෙක්දුරට හේතු වීද?

******************************

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
2013 මැයි - අගෝස්තු

## සමාජීය විද්‍යා පීඨය

**ඉතිහාසය - HIST - E 1015**

පැරණි ශිෂ්ටාචාර

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. ලොව පැරණිතම ශිෂ්ටාචාරය ලෙස සුමේරියානු ශිෂ්ටාචාරය හඳුන්වනු ලබන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

02. සුමේරියානු රාජත්වය වර්ධනය වූ ආකාරය විස්තර කරන්න.

03. බැබිලෝනියානු ශිෂ්ටාචාරය තුළ හමුරාබි වැදගත් වන්නේ මන්ද?

04. ඊජිප්තු වැසියන්ගේ ආගමික ඇදහිලි විස්තර කරන්න.

05. 'ශිෂ්ටාචාරය' යනු කුමක්දැයි සැකෙවින් අර්ථ දක්වා චීන ශිෂ්ටාචාරය ආරම්භවීමට හා වර්ධනය වීමට බල පෑ ප්‍රධාන සාධක ගෙනහැර දක්වන්න.

06. චීන සංස්කෘතික ඉතිහාසයෙහි ලා ෂං රාජවංශ අවධිය වැදගත් වන අයුරු පරීක්ෂා කරන්න.

07. ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

08. ග්‍රීක සංස්කෘතික දියුණුව සැකෙවින් සමාලෝචනය කරන්න.

09. රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා කවරේද?

10. ක්‍රිස්තියානි ආගම රෝම අධිරාජ්‍යයේ රාජ්‍යාගම බවට පත් වූ අන්දම විස්තර කරන්න.

****************************

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
2011 අප්‍රේල් / මැයි

### සමාජීය විද්‍යා පීඨය

### ඉතිහාසය - HIST - E 1015

### පැරණි ශිෂ්ටාචාර

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. නාගරිකත්වය කරා මිනිසාගේ වර්ධනය මෙසපොතේමියානු ශිෂ්ටාචාරය තුළින් පිළිබිඹු වන අන්දම පරීක්ෂා කරන්න.

02. හමුරාබි නීති සංග්‍රහය ඇසුරෙන් බැබිලෝනියානු ශිෂ්ටාචාරයේ ආර්ථික හා සාමාජීය ලක්ෂණ පරීක්ෂා කරන්න.

03. පුරාණ ඊජිප්තු වැසියන් මළවුන් සම්බන්ධයෙන් දක් වූ ආකල්පය සැකෙවින් විස්තර කොට මෘතදේහ සම්බන්ධයෙන් ඔවුන් අනුගමනය කළ ක්‍රියාමාර්ග විස්තර කරන්න.

04. පහත දක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.
    - අ) සුමේරියානු රාජත්වයේ වර්ධනය
    - ආ) ගිල්ගමෙෂ්
    - ඇ) ඇසියාරියානු අධිරාජ්‍යය
    - ඈ) II නෙබුශෙඩ්නෙසර් සමයේ බැබිලන් නගරය

05. ෂං රාජ වංශ සමයේ චීනයේ පැවති සමාජ තත්ත්වයන් හා සංස්කෘතිය විස්තර කරන්න.

06. ජෝව් යුගයේ පැවති සාමාජික හා ආර්ථික තත්ත්වයන් හා සංස්කෘතිය විග්‍රහ කරන්න.

07. පැරණි ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමය හඳුන්වා දී ඒවායේ පැවති ආණ්ඩුක්‍රම විස්තර කරන්න.

08. කුඩා රාජ්‍යයක සිට අධිරාජ්‍යයක් දක්වා රෝමය ව්‍යාප්ත වූ ආකාරය පැහැදිලි කරන්න.

09. රෝම අධිරාජ්‍යය තුළ ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත වූ ආකාරය විස්තර කරන්න.

10. බටහිර රෝම අධිරාජ්‍යයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණ කෙටියෙන් දක්වා ඒවායෙන් උද්ගත වූ ප්‍රතිඵල විමසන්න.

****************************

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
2011 අප්‍රේල් / මැයි

**සමාජීය විද්‍යා පීඨය**

**ඉතිහාසය - HIST - E 1025**

**ක්‍රි. ව. 1526 දක්වා ඉන්දියාවේ ඉතිහාසය**

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ඉන්දියාවේ ඉතිහාසය හැඩගැස්වීම කෙරෙහි භූගෝලීය සාධක බලපා ඇති ආකාරය පරීක්ෂා කරන්න.

02. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ පිරිහීම හා බිඳවැටීම සම්බන්ධයෙන් පවත්නා විවිධ මත සැකෙවින් සමාලෝචනය කරන්න.

03. පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම **<u>දෙකක (02)</u>** ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.

    i. පශ්චාත් වෛදික සමාජය
    ii. "මහා ජනපද"
    iii. අශෝක ශිලා ලේඛන
    iv. සංගම් සාහිත්‍යය

04. චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ කාර්යසාඵල්‍යය ප්‍රමාණ කරන්න.

05. ඉන්දියාවේ සංස්කෘතික ඉතිහාසයෙහි ලා කුෂාණවරුන්ගේ දායකත්වය පරීක්ෂා කරන්න.

06. සමුද්‍ර ගුප්ත රාජ්‍ය කාලයේදී, ගුප්ත අධිරාජ්‍යයේ වර්ධනයේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න.

07. පල්ලව පාලකයන් යටතේ සිදු වූ සංස්කෘතික වර්ධනය විස්තර කරන්න.

08. දකුණේ අධිරාජ්‍යයක් ගොඩනැගීමෙහි ලා චෝළයන්ගෙන් ඉටුවූ සේවය පරීක්ෂා කරන්න.

09. දිල්ලි සුල්තාන් රාජ්‍යයේ බලය තහවුරුවීමට වහල් පෙළපතෙන් ඉටු වූ සේවය සාකච්ඡා කරන්න.

10. අලා - උද් - දීන් - බල්ජි යටතේ දිල්ලි සුල්තානයේ බලය ව්‍යාප්ත වූ අයුරු පරීක්ෂා කරන්න.

*********************